2023 ඔක්තෝබර්

# පුරවැසියා

බිම් මට්ටමේ කතිකාව 2



ආදිවාසි නායක ඇතුළු ප්‍රජාවගේ නියෝජිතයින් අගමැතිතුමාට සන්දේශයක් භාරදුන් අවස්ථාව (ඡායාරූපඃ Parliament of Sri Lanka)


- ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන්ගේ මූලික අයිතිවාසිකම් 03
- ක්ෂුද්‍රමූල්‍ය බාඳුරා ගොටුවේ සිර වූ ආදිවාසී කාන්තාවෝ 04
- පය බරවාට පිටකර බෙහෙත් බැඳීම 06
- ආදිවාසීන්ගේ සියලුම ගැටලු අගමැතිට දැනුම් දී තිබෙනවා 09
- මේවා දිග පළල තැනෙක තිබෙන ප්‍රශ්න 10




ඡායාරූපඃ dailynews.lk

## ප්‍රශ්න පොප්ප එහෙමමයි

- ආදිවාසී නායක ඌරුවරිගේ වන්නියලා ඇත්තෝ

ආදිවාසීන්ට කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්න ගැන අපි පාර්ලිමේන්තුවට ගිහින් සංදේශයක් අගමැතිතුමාටයි කතානායකතුමාටයි දුන්නා. මේ අවුරුද්දේ ජනවාරි මාසේ තමයි බාර දුන්නේ. තවම ඒකට කිසිම උත්තරයක් නෑ. අපේ ප්‍රශ්න වලට විසඳුම් නෑ.

05



ඡායාරූපඃ dailynews.lk

## අගමැතිතුමනි විසඳුම් පොප්ප ක්‍රියාත්මක කරන්න

ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ඔවුන්ගේ ගැටලුවලට ස්ථිරසාර විසඳුමක් ලබා දීමට රජය කටයුතු කරන බව සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක පාර්ලිමේන්තුවේදී පැවසුවේ 2023 ජනවාරි මස 18 වැනිදා ය.

02

## 01 පිටුවෙන්
## අගමැතිතුමනි විසඳුම් පොජ්ජ

සංස්කෘතික කටයුතු රාජ්‍ය ඇමතිවරයාගේ ප්‍රකාශයට නම මසක් ගෙවෙන තැන ඉහත ප්‍රකාශය කොතෙක් පණ ලබා ඇත්දැයි අපි අමාත්‍යවරයාගෙන් නැවත විමසුවෙමු.

“ආදිවාසී ජනතාවගේ ගැටලු විසඳීමට විවිධ ක්‍රියා මාර්ග ගනිමින් ඉන්නවා. අප අමාත්‍යයන්ශයේ සංවර්ධන උරුමය කාර්යාලය ඒ වෙනුවෙන් සැහෙන වැඩ කොටසක් කරනවා” යනුවෙන් ඔහු පැවසීය.

එම වැඩ කොටසේ ප්‍රගතිය කුමක්දැයි විමසීමේදී සංවර්ධන උරුමය අතිරේක ලේකම් නිශාන්ති ජයසිංහ මහත්මිය දැනට ගෙන ඇති පියවර රාශියක් පිළිබඳ පියවරෙන් පියවර පැහැදිලි කළාය. (ඒ පිළිබඳ දීර්ඝ ලිපියක් ඇතුළු පිටුවක පළ වේ.)

ආදිවාසී ගැටලු පිළිබඳ සකස් කළ දීර්ඝ ලියවිල්ලක් ඇති අතර, විවිධ ගැටලුවලට ඊට අදාළ අමාත්‍යාංශවලින් කළ ඉල්ලීම් ප්‍රතිචාර ඒ තුළ අන්තර්ගතය. එහෙත් තවමත් ප්‍රශ්නය ඇත්තේ අයාලේ යමිනි. එය එක් තැනකට ගෙන විසඳුම් සොයනුයේ කෙසේද? වර්තමානයේ ඇති ප්‍රධාන ගැටලුව එයයි. සංවර්ධන උරුම අතිරේක ලේකම් නිශාන්ති ජයසිංහ මහත්මිය පවසනුයේ තම අමාත්‍යාංශය සකස් කළ ආදිවාසී ජනයාගේ ගැටලු විසඳීමේ ලියවිල්ල අගමැති වරයාට බාර දුන් බවය. ආදිවාසීන් තම අමාත්‍යාංශයට අයත් වුවද ඔවුන්ගේ ගැටලු විසඳීමට විවිධ අමාත්‍යාංශවල මැදිහත් වීම් අවශ්‍ය බැවින් එය සාර්ථක කර ගැනීමට අගමැතිවරයාගේ සහාය බලාපොරොත්තු වන බව ජයසිංහ මහත්මිය පැවසුවාය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, ජල සම්පාදන අමාත්‍යාංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, ළමා ආරක්ෂක අධිකාරිය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යන පුළුල් පරාසයක අමාත්‍යාංශ එකමුතුවක සහාය නොමැතිව ආදිවාසී ගැටලු විසඳීම දුෂ්කර වී ඇත. එසේනම් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය උත්සාහ කරනුයේ මේ සියලු අමාත්‍යාංශ එකට එකතු කොට ප්‍රශ්න විසඳීමක් අගමැතිවරයා හරහා බලාපොරොත්තු වීමය. ඒ පරමාර්ථයෙන් ආදිවාසී ගැටලු මේ වනවිට අගමැතිවරයා අත විසඳුම් බලාපොරොත්තුවෙන් නැවතී ඇත.

**ආදිවාසීන් වෙසෙන සියලු පළාත්වල ක්ෂේත්‍ර අධ්‍යනයන් කොට ඔවුන් මුහුණ දෙන විවිධ ගැටලු සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සකස් කළ ප්‍රතිපත්ති හා ඉල්ලීම් මාලාවක් කථානායක වරයාට හා අග්‍රාමාත්‍ය වරයාටද විපක්ෂ නායක වරයාටද ඉදිරිපත් කොට ඇත. ඒ පසුබිම හරහා පාර්ලිමේන්තුවේ විවාද වූ ආදිවාසී ගැටලු කල් නොමරා විසඳීම ජාතික අවශ්‍යතාවයක් බව කිව මනාය.**

මෙය මෙරට ආදීම මිනිසුන් පිළිබඳව නොවිසඳුණු බරපතළ ප්‍රශ්නයක් බව ඉතාම පැහැදිලිය. එම පිරිසට මෙරට ඇති අයිතීන් කොතරම් නම් අයිති නැති වී ඇත්ද යන්න මේ ප්‍රශ්නය ලිහා ගැනීමට බැරි තරම් ගැටලුකාරී වීමෙන්ම පැහැදිලිය.

ඉතා සුළු සුළු වශයෙන් කතා බහට ලක් වූ මෙම ආදිවාසී ගැටලු නිසි කතා බහකට ගෙන ආවේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයය කළ මැදිහත් වීම හේතුවෙනි. ඌව නැගෙනහිර, අතුරු මැද සහ ආදිවාසීන් වෙසෙන සියලු පළාත්වල ක්ෂේත්‍ර අධ්‍යනයන් කොට ඔවුන් මුහුන දෙන විවිධ ගැටලු සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සකස් කළ ප්‍රතිපත්ති හා ඉල්ලීම් මාලාවක් කථානායකවරයාට හා අග්‍රාමාත්‍යවරයාටද විපක්ෂ නායක වරයාටද ඉදිරිපත් කොට ඇත. ඒ පසුබිම හරහා පාර්ලිමේන්තුවේ විවාද වූ ආදිවාසී ගැටලු කල් නොමරා විසඳීම ජාතික අවශ්‍යතාවයක් බව කිව මනාය. වැදිනායක ඌරු වරිගේ වන්නියල ඇත්තන් කියනුයේ ආදිවාසී ජනතාවගේ පැවැත්ම අයිතීන් සහ නිදහස පිළිගෙන ඔවුන්ගේ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය කරමින් නව පනතක් සැකසීම කාලීනම විසඳුම බවයි.

ඒ සියලු කාර්යයන් සඳහා පාර්ලිමේන්තුව තුළ මේ කතිකාව පවත්වාගෙන යෑම අවශ්‍යය. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ස්ථාවර නියෝග 27/2 යටතේ යොමු කළ ප්‍රශ්නයක් අරබයා එදා ජනවාරි මාසයේ සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක දුන් පොරොන්දු ඉටු කිරීමට කාලය එළැඹ ඇත. එය අගමැති අත නතර නොවී ඉදිරියටම යා යුතුය.

අප වන්නියල ඇත්තන්ගෙන් මේ ගැන කළ විමසීමේදී ඔහු පැවසුවේ තම ආදිවාසී ගැටලු නිසි ලෙස අවබෝධ කරගෙන විශාල දායකත්වයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලබා දුන් බවත් එය යථාර්ථයක් බවට පත් කිරීම ආණ්ඩු ඇත්තන්ගේ වගකීම බවත් ය. මෙය ජනපතිවරයා සියතට ගෙන විසඳාලිය යුතු බව වන්නියල ඇත්තන්ගේ අපේක්ෂාවයි. ■

**- පුරවැසියා**



# ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන්ගේ මූලික අයිතිවාසිකම්

ශ්‍රී ලාංකීය පුරවැසියන් නිදහස් රාජ්‍යයක හිමිකාරීත්වයේ 75 වන වසර සමරන මේ මොහොත, ස්වදේශීය ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අප සිටින තැන ගැන අවධානය යොමු කිරීමට සුදුසුම අවස්ථාවකි. ස්වදේශීය ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සම්මත කර ගන්නා ලද්දේ 2007 සැප්තැම්බර් 13 වැනිදය. එයින් වසර 15ක් ගත වී ඇතත්, එම ප්‍රඥප්තිය ප්‍රකාරව, මෙරට ස්වදේශීය ජනකොටස්වල පැවැත්ම සහ නිදහස සහතික කෙරෙන නීතියක් සම්මත කර ගැනීමට ශ්‍රී ලංකාව තවමත් සමත්ව නැත. පුරවැසි නියෝජිතයන්ද, ප්‍රතිපත්ති සම්පාදකයන්ද දේශපාලන පක්ෂවල නායකයන් හා තීරණ ගන්නන් ඇතුළු නියෝජිතයන්ද සිවිල් සමාජ ක්‍රියාකාරීන් හා අනෙකුත් පාර්ශ්වයන්ද සමග එක්ව, එය ඉටු කර ගැනීමේ කඩිනම් අවශ්‍යතාව සහ වගකීම අප සැවොම ඉදිරියේ ඇත.

ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවන්ගේ මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට හිතකර සමාජ-ආර්ථික හා දේශපාලන පරිසරයක් ඔවුන්ට හිමිවන්නේද යන කාරණය වසර 75ක නිදහසක් සමරන මේ අවස්ථාවේදීත් ප්‍රශ්නාර්ථයකි. ඔවුන්ගේ අනන්‍යතාව, සමාජ ආර්ථික හා සංස්කෘතික ගතිකත්වයන් මෙන්ම පරිචයන් කෙරෙහි සංවේදීතාවක් පිළිබිඹු කරන නෛතිකමය හෝ ප්‍රතිපත්තිමය පිළිගැනීමක් නොමැත. ආදිවාසී ප්‍රජාවන් අඛණ්ඩවම මර්දනයට හා නොසලකාහැරීමට මෙන්ම වෙනස් කොට සැලකීමට භාජනය වීමේ අනාරක්ෂිත පසුබිම මෑතකාලීනව වඩ වඩාත් තීව්‍ර වී තිබේ. මෙය ආසියාකරයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට පිවිසි පැරණිම රාජ්‍යයක් වශයෙන් අප රට මුහුණ දී ඇති අවාසනාවන්ත තත්ත්වයකි.

ඒ හේතුවෙන් අද වන විට මෙරට වෙසෙන විවිධ ආදිවාසී ප්‍රජා කණ්ඩායම්වල සමාජ-ආර්ථික තත්ත්වයන් පිළිබඳව විධිමත් සහ යාවත්කාලීන වූ දත්ත හා තොරතුරු පවා අප සතුව නැත. 1963න් පසුව පැවැත්වූ ජන සංගණනවලදී, ජනවර්ග පිළිබඳ වර්ගීකරණයෙන් 'වැදි' යන අනන්‍යතාව ඉවත් කර තිබීම මෙයට ප්‍රධාන හේතුවයි. එය ඔවුන්ට සිදු කළ බලවත් අගතියකි. එමෙන්ම ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ, ප්‍රවර්ධනය කිරීමේ, තම භාෂාව භාවිත කිරීමේ, ජීවනෝපායේ යෙදීමේ සහ යාමේ ඊමේ නිදහසට මෙන්ම, තමන් මෙරට ආදිවාසීන් වශයෙන් හඳුන්වා ගැනීමේ ආත්මාභිමානයටද එල්ල වී ඇති ගැටලු සහ අභියෝග මෙතෙකැයි කිව නොහැක. බොහෝ විධායක හෝ පරිපාලනමය තීන්දු තීරණ මෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයන්හි ක්‍රියාකලාපයද මෙරට ආදිවාසී ප්‍රජාවන්ගේ පැවැත්ම සහ නිදහස සම්බන්ධයෙන් සමාජයක් වශයෙන් අප කෙතරම් අසංවේදීද යන්න නැවත නැවතත් තහවුරු කරයි. මෙවැනි තත්ත්වයන් උද්ගත වීම යනු දශක ගණනාවක් තිස්සේ මෙරට පොදු සමාජයෙන් සිදුවෙමින් පවතින වරදක් තවදුරටත් සමාජගත වීම මිස අනෙකක් නොවේ.

> මෙරට ස්වදේශීය ජනකොටස්වල පැවැත්ම සහ නිදහස සහතික කෙරෙන නීතියක් සම්මත කර ගැනීමට ශ්‍රී ලංකාව තවමත් සමත්ව නැත.

එබැවින්, මෙරට පොදු සමාජය තුළින් සිදු වූ එකී වරද නිවැරදි කිරීමට, 75 වසරක නිදහස සැමරීමට සූදානම් වන මේ මොහොත වඩාත්ම උචිත වූත් ඓතිහාසික වූත් අවස්ථාවක් බව අපගේ අදහසයි. මෙරට ආදිවාසී ප්‍රජාව යනු, ඉඩම්, ජලය, වනසතුන් හා ඔවුන්ගේ වාසස්ථාන ආශ්‍රිත පරිසර පද්ධතීන් ඇතුළු ස්වභාවික සම්පත් සුරැකීමේ භාරකරුවන්ගේ භූමිකාව සඳහා ඉතාම සුදුසු ජන සමූහයකි. එලෙස ඔවුන්ගේ වටිනාකම් අලුතින් හඳුනාගැනීමේ අවස්ථාව මෙන්ම ජීවත්වීමේ මූලික අයිතිවාසිකමේ වඩාත් පුළුල් නිර්වචනය තුළ ඒ සඳහා ඔවුන් තවදුරටත් ශක්තිමත් කිරීමේ මූලික පියවර ගැනීමේ වගකීම ඔබ අප සැම ඉදිරියේ ඇත.

ආදිවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ එකඟතාවලට ගරු කිරීමට රාජ්‍යයේ කැපවීම විධිමත් ලෙස පිළිගනිමින්, වර්ෂ 1989 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආදිවාසී සහ ගෝත්‍රික ප්‍රජාව පිළිබඳ සම්මුතිය, (ILO Convention 169) අපරානුමත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගනිමින් ඒ සඳහා අවැසි දේශපාලන කැමැත්ත සහ කැපවීම පිළිබිඹු කිරීමට මෙය අවස්ථාවක් කරගනු ඇති බවට අපි දැඩිව විශ්වාස කරමු. ■

**ලයනල් ගුරුගේ**
ජ්‍යෙෂ්ඨ පර්යේෂක
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# ක්ෂුද්‍රමූල්‍ය බාඬුරා ගොටුවේ සිර වූ ආදිවාසී කාන්තාවෝ

වෙල්ලස්ස හා බිම්තැන්නේ දඹාන කේන්ද්‍ර කරගෙන සිය සංස්කෘතිය රැක ගනිමින් වනාන්තර ආශ්‍රිතව ජීවත් වූ වැදි ජනයාට සිය නිජබිම් හැර යෑමට සිදු වූයේ විවෘත ආර්ථිකය සමග මෙරට විසිරුණු සංවර්ධනයේ අරුණලු හේතුවෙනි. එකී අරුණැල්ල වැදි ජනයාගේ සංස්කෘතිය, ජීවන මාර්ග හා නිජබිම් පුළුස්සා දැමූ ගිනිදැල්ලක් වූවා මිසක කිසිවිටෙක ඔවුන්ගේ ජීවිතෙවලට ආලෝකය උදා කර නොදුන්නේය. ඔවුන්ගේ ජීවිත සංවර්ධනය නිසා හටගත් ගිනි දළුවල යෝධ සෙවණැල්ලෙන් වැසී ගියේය.

හිතුමනාපයේ මංගැච්චූ රුකුල් පොජ්ජවල් අභය භූමි හා වනෝද්‍යාන බවට පත්ව 80 දශකයේදී වැදි ජනයා ඒ බිමෙන් බලහත්කාරයෙන් පන්නා දැමිණි. මේ නිසා ඔවුන්ට දඩයම හා පැණි කැඩීම තහනම් විය. දඩයම හා බැඳී තිබුණු බොහෝ සංස්කෘතික යුතුකම්ද නෑ යකුන් පිදුම වැනි චාරිත්‍රද අත්හැරී ගියේ කාලයක් පුරාවට ඒවා ඉටු කළ වනාන්තර තුළට වැදීම ආණ්ඩුවේ මහ හූරන් විසින් නීති හා අණ පනත් මගින් තහනම් කිරීම හේතුවෙනි.

මේ නිසාම සිය ජීවිකාව ගෙන යෑමට බොහෝ දෑ කිරීමට වැද්දන්ට සිදුව තිබේ. දිඹුලාගල, දලුකාන තරුණ වැදි නායකයා ජීවත්වීමට කොන්ක්‍රීට් අනයි. ඔහුගේ රැහේ සෙසු තරුණයෝද ජීවත්වීමේ අරගලය තුළ කුලී වැඩ කරති. පරම්පරා ගණනාවක් ජීවත් වූ දිඹුලාගල මහ වනයේ ගල් ලෙන් බුදු පුතුනට පූජා කොට පාරම්පරික ගල්ගෙය මෙන්ම සිය බඩවියතද අහිමි කරගෙන කඳු බෑසි මේ මිනිස්ගජ්ජු ජීවත්ව සිටිත්දෝ කුමක් කරද්දෝ කොහි ඇත්දෝ යන්න කිසිවකු සොයා නොබැලීම හේතුවෙන් බොහෝ අසරණව දිවි ගෙවති.

## කොම්පැනි හූරලාගේ පහසු ගොදුරු

ආණ්ඩුවේ වගකිවයුත්තන් සිය වගකීම් පැහැර හැරීම නිසා දරිද්‍රතාවයේ ගොදුරක් බවට පත්ව ඇති වැදි ජනයා ගොදුරු කර ගැනීමට, දශකයකට පෙර හතු පිපෙන්නාක් මෙන් මෙරට පිපී ගිය ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ද ඉව අල්ලනුයේ මෙවැනි පසුබිමකය. වැදි ජනයා සොයා ඈත නියම්ගම් තුළට වැදුණු මෙම සමාගම් සිය රාජකාරිය යුහුසුලුව අරඹා තිබේ. මළපොතෙහි අකුරක් බැරි වැදි ජනයා සිය පහසු ගොදුරු ලෙස හඳුනාගෙන ඇති මෙම සමාගම් හෙනිනාගල, අම්පාර-පොල්ලෙබැද්ද, ගල්වල යාය හා දිඹුලාගල-දලුකාන වැදි ජනයා උපක්‍රමශීලී අයුරින් සිය ණය උගුලෙහි ගොදුරක් බවට පත් කර ගෙන ඇති අයුරු පෙනීයයි.

රක්ෂිත වනාන්තර තුළට පිවිසීම තහනම් වීමත්, වගා කිරීමට කුඹුරු ඉඩම් නොමැතිකමත් නිසා මේ වැදි ජනයා බොහෝ අසරණව ආර්ථික වශයෙන් පීඩාවට පත්ව සිටිති. පැණි කැඩීමට හා කටු අල හෑරීමට පමණක් කැලෑ වැදීමට යම් ලිහිල් බවක් පැවැතීම ජීවත්වීමට කිසියම් අස්වැසිල්ලක් බැව් ඔවුහු කියති. වගාවක් කෙරුමට හෝ ඉඩමක් නොමැතිකමින් පීඩා විඳින අම්පාර ගල්වලයාය වැදි ගමෙහි කාන්තාවන් රැසක්ම ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල ගොදුරු බවට පත්ව සිටිති.

*ණය ගත් වැදි රැහේ ඇත්තියන් පැවැසුවේ ණය දෙන මහත්වරුන් පුරවා දුන් කරදහි පෝරම්වල අස්සන් ගැසූ බව පමණක් තමන් දන්නා බවය.*

රුපියල් 30,000 කින් පටන් ගන්නා කණ්ඩායම් ණය ඇතැම් සමාගම් සති වාරික ලෙස අය කරයි. ඇතැම් සමාගමක් සිය වාරිකය මාසිකව අය කර ගනී. කෙසේ වෙතත් අකුරු නොදන්නා මේ මිනිසුන් ඔවුන් පහසුවෙන් ගොදුරු කර ගනුයේ ඔවුන්ගේ ජීවිත වටා දැවටී ඇති දරිද්‍රතාවයේ සෙවණැල්ල හේතුවෙනි.

කතුන් පමණක් ඉලක්ක කර ණය දෙන ක්ෂුද්‍රමූල්‍ය සමාගම්



ඌරු වරිගේ අනුලාවතී



ඌරු වරිගේ විමලාවතී



තලා වරිගේ කුසුමාවතී



ඌරුවරිගේ අනුලාවතී

මුලින්ම කරන්නේ කුඩා කණ්ඩායම් ඇටවීමයි. එකම පවුලේ අයට ණය නොදීම සම්මතය යැයි කීවද, ආර්ථිකය නගා සිටුවීමට උපකාරයක් ලෙස යැයි එකම රැහේ අයට ණය දී වැදි ජනයාද සෙසු ගැමි කාන්තාවන් සේම ණය උගුලකට සිරකර ඇති සැටි පෙනී යයි.

ණය ගත් වැදි රැහේ ඇත්තියන් පැවසුවේ ණය දෙන මහත්වරුන් පුරවා දුන් කරදහි පෝරම්වල අස්සන් ගැසූ බව පමණක් තමන් දන්නා බවය.

හෙනානිගල වැදි ගමෙහි කාන්තාවක වන ඌරුවරිගේ අනුලාවතී පැවසුවේ මසුන් ඇල්ලීම සඳහා සිය සැමියාට දැල් ගැනීමට ණය ගත්තද ඒවා සිය පවුලේ පරිභෝජන කටයුතු සඳහා වියදම් වීමෙන් ණය ගෙවා ගැනීමට නොහැකි වූ බවයි.

ක්ෂුද්‍රමූල්‍ය උගුලට සිර වී ඇති තවත් වැදි ගමක් වනුයේ හෙනානිගලයි. ගැටලුව විසඳීමට රැහේ නායක ඇත්තන්ටද නොහැකිව තිබේ. ඒ රැහේ සෙසු මිනිස්ගජ්ජන් වෙළී ඇති දුප්පත්කම නිසා ඇතිව තිබෙන ආර්ථික ගැටලු, ණය ගැනීමට බල කෙරෙන තැනට රැහේ ඇත්තන් පත් කර ඇති හෙයිනි. හෙනානිගල වැදි ජනයා අතරද බොහෝ පිරිසක් ණය උගුලට ගොදුරුව සිටිති.

## දලුකානත් ණය උගුලේ

දිඹුලාගල, දලුකාන වැදි ජනයාද ක්ෂුද්‍රමූල්‍ය ණයෙහි ගොදුරක්ව ඇති බව එහි ආදිවාසී නායක තලාවරිගේ ප්‍රියන්ත ඇත්තන් පවසයි. ඔහු පවසනුයේ වනජීවී නිලධාරීන් හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සිය පාරම්පරික වනාන්තර පෙදෙසට පිවිසීම අවහිර කිරීම නිසා තමන්ගේ රැහේ ඇත්තන් මෙම ණය උගුලෙහි ගොදුරු බවට පත්ව ඇති බවයි.

## රජය මැදිහත් විය යුතුයි

මෙරට ආදිවාසී වැදි ජනයා ක්ෂුද්‍රමූල්‍ය නම් බාඳුරා ගොටුවේ ගොදුරක්ව අසරණ වී ඇතැයි පවසන ජාතික සහයෝගීතා සංවර්ධන පදනමේ සභාපති සුරංග රූපසිංහ වැඩිදුරටත් පැවසුවේ ක්ෂුද්‍රමූල්‍ය ණය වසංගතය සාමාන්‍ය ගොවි කම්කරු ජනයා පමණක් නොව මෙරට වැදි ජනයාද ආක්‍රමණය කර ඔවුන් දරිද්‍රතාවයේ අන්තයටම හෙළා ඇති බවයි.

වැදි ජනයා මුහුණ දෙන මෙම කනගාටුදායක තත්ත්වය පිළිබඳව අවධානය යොමු කර නැගෙනහිර මුහුදු ආදීවාසී ජනයාට යම් සහනයක් ලබා දීම වෙනුවෙන් රජයේ නිලධාරීන් හා සාකච්ඡා කිහිපයකට එක්ව කටයුතු කළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලයනල් ගුරුගේ මහතා පවසනුයේ ආදිවාසීන් කෙරෙහි ක්‍රියාත්මක මෙරට රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ ඛේදනීය තත්වයක් දක්නට හැකි බවයි. ඕස්ට්‍රේලියානු රජය එරට ආදිවාසීන් හට දක්වන ගෞරවය හා සැලකීම අප රටේ ආදිවාසීන්ට හිමි නොවීම තුළ ඒ බව මනාව පැහැදිලි වන බවයි.

**- ලක්මාල් බදුගේ**

01 පිටුවෙන්

## ප්‍රශ්න පොජ්ජ...

ඒ සංදේශයේ තිබෙන්නේ අපට තිබෙන ඉඩම් ප්‍රශ්න, වන අලින්ගෙන් තිබෙන ප්‍රශ්න, කැලෑවට යන්න දෙන්නෙ නැති ප්‍රශ්න වගේ ප්‍රශ්න තමයි. අපේ අය මාළු අල්ලන්න කැලේ හරහා ගියොත් අල්ලලා දඩ ගහනවා.

අවුරුද්දක් ගානේ අපි දළදා මාලිගාවට මී පැණි පූජා කරනවා. මී කඩන්න කැලේට යන්නම ඕනෙ. ඒත් වනජීවී දෙපාර්තමේන්තුවෙන් අපට යන්න දෙන්නෙ නෑ. හොරෙන් ගිහින් තමයි අපේ අය දළදා පූජාවට මී පැණි හොයා ගන්නෙ. ඒත් අහුවුනොත් අල්ලලා උසාවියට දාලා දඩ ගහනවා.

අපේ ප්‍රශ්නවලට උත්තර දෙන්න එක්කෙනෙකුට බෑ. සංස්කෘතික රාජ්‍ය ඇමති විදුර වික්‍රමනායක හූරා නම් මනුසත්කම ඉහළින්ම තියෙන කෙනෙක්. ඒත් එයාට තනියම මේක කරන්න බැහැ. ජනාධිපතිතුමා ඇතුළු මුළු ආණ්ඩුවම තමයි මේකට උත්තර හොයලා දෙන්න ඕනෙ. ඒත් වෙන දේවල්වල හැටියට ඒ අයට අපේ ප්‍රශ්නෙට විසඳුමක් දෙන්න ඕන කමක් තිබෙන බවක් පේන්න නැහැ. විපක්ෂනායකතුමාත් මේ ගැන පාර්ලිමේන්තුවේදී කතා කරල තියෙනවා. ඒත් එතුමාටත් විපක්ෂයේ ඉඳගෙන අපේ ප්‍රශ්නෙ විසඳන්න බැනේ. මෙහෙම ගියොත් ආදිවාසීන් කියලා කියන මිනිස්සු නැත්තටම නැති වෙලා යාවී. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මේ වන කොට අපිට තිබෙන ප්‍රශ්න ගැන කතා බහ කරලා ඉස්සරහට අරගෙන යනවා. ආණ්ඩුවේ ඇත්තන්ගෙන් නම් කිසිම විසඳුමක් තාම නෑ. ■

**- පුරවැසියා**

# පය බරවායට පිටිකර බෙහෙත් බැඳීම

**ආදිවාසී ගැටලු සම්බන්ධයෙන් 2023 ජනවාරි 18 දින විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ස්ථාවර නියෝග 27(02) යටතේ ආදිවාසී ගැටලු ඉදිරිපත් කිරීම සහ ඊට විෂය භාර ඇමතිවරයා ලෙස සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක දුන් පිළිතුරු මෙහි සඳහන්ය. මේ වන විට ඒ සඳහා මාස 9ක් ගත වී ඇති අතර ආදිවාසී ගැටලුවලට විසඳුම් ලැබී ඇත්ද?**




- **සජිත් ප්‍රේමදාස මහතා**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලොව පුරා පිටින ආදිවාසීන්ගේ අයිතිවාසිකම්, ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය - UNDRIP - හරහා ජාත්‍යන්තරව පිළිගෙන තිබෙනවා. කෙසේ නමුත්, මෙරට ප්‍රදේශ ගණනාවක වාසය කරනු ලබන ආදිවාසී ප්‍රජාවට අද බොහෝ ගැටලුවලට මුහුණ දීමට සිදුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ආදිවාසී ප්‍රජාව ඉන්න දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ, ග්‍රාම නිලධාරි වසම්, කුඩා ගම්මාන, ඒ ජනගහනය කොපමණද, පවුල් ප්‍රමාණය කොපමණද කියලා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේවත් හරියාකාර දත්ත නැහැ, ඒ පිළිබඳව අපි සියලුදෙනාම රටක් හැටියට ලජ්ජා වෙන්නට ඕනෑ. මම මේ එක්කෙනෙකුට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට වහාම ඒ පිළිබඳව නියෝගයක් ලබා දෙන්න කියලා, ආදිවාසී පවුල් කොච්චර ඉන්නවාද, ඒ ජනගහනය කොච්චරද, කොයි ප්‍රදේශවල, කොයි ගම්මානවල ඒ අය සිටිනවාද යන්න පිළිබඳව නිවැරදි දත්ත සැකසීමක් වහාම ක්‍රියාත්මක කරන්නය කියලා.

රට තුළ ක්‍රියාත්මක වන බොහොමයක් නීති රෙලොසි නිසා මෙම ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් රැසක් සීමා වී තිබෙනවා. ආදිවාසී ජනතාවගේ පාරම්පරික ජීවන රටාවට බාධා ගෙන දෙන එම විවිධ නීති, අණපනත් සංශෝධනය කරමින් ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි නව නීති සම්පාදනය කිරීමට රජය විශේෂ අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

ඒ අනුව, මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් මම රජයෙන් බලාපොරොත්තු වෙනවා.

**1. මෙරට ආදිවාසී ප්‍රජාවගේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික, සිවිල් හා දේශපාලන අයිතීන් ආරක්ෂා කිරීම සඳහා නිශ්චිත නීති මාලාවක් සම්පාදනය කළ යුතු බව රජය පිළිගන්නේද?** එසේ නම් ආදිවාසී ප්‍රජාවගේ සම්ප්‍රදායයන් සහ සංස්කෘතිය සුරක්ෂිත වන පරිදි නව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජය කටයුතු කරන්නේද? එසේ නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වශයෙන් ආදිවාසී ජනතාවට පිළිගැනීමක් ලබාදීමට කටයුතු කරන්නේද? එසේම, ආදිවාසීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පළාත් ආණ්ඩු සහ පළාත් පාලන ආයතන විසින් ප්‍රඥප්ති සහ අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට පියවර ගත යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් රජය

*රට තුළ ක්‍රියාත්මක වන බොහොමයක් නීති රෙලොසි නිසා මෙම ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් රැසක් සීමා වී තිබෙනවා. ආදිවාසී ජනතාවගේ පාරම්පරික ජීවන රටාවට බාධා ගෙන දෙන එම විවිධ නීති, අණපනත් සංශෝධනය කරමින් ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි නව නීති සම්පාදනය කිරීමට රජය විශේෂ අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.*

අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්නේ ද? මේ සඳහා නිශ්චිත කාල රාමුවක් ඉදිරිපත් කළ හැකි වන්නේද? නොඑසේ නම්, ඒ මන්ද?

**2. ආදිවාසී සහ ගෝත්‍රික ජනතා සම්මුතිය නෛතික වශයෙන් බලාත්මක කොට විධිමත් වැඩ පිළිවෙළක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම කඩිනම් අවශ්‍යතාවක් ලෙස රජය පිළිගන්නේ ද?**

එසේ නම්, මෙරට ආදිවාසි සහ ගෝත්‍රික ජනතා සම්මුතිය අපරානුමත කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රජය කටයුතු කරන්නේද? එය ක්‍රියාවට නංවන නිශ්චිත දින වකවානු කවරේද?

ගරු අග්‍රාමාත්‍යතුමනි, international conventions තියනවා, internatimal protocols තිබෙනවා, ආදිවාසී ප්‍රජාව ආරක්ෂා කරන සහ සුරක්ෂා කරන. අපි ඒ protocols, විශේෂයන්ම United Nations Declaration on the Rights of Indigenous Peoples - UNDRIP - සම්මුතිය 2007 වසරේදී සම්මත කරලා තිනවා. ඒ UNDRIP 42 වන වගන්තිය මගින් බොහෝ රාජ්‍යයන් මේ සම්මුතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කළ යුතු බවට 2007දී පිළිගෙන තිබෙනවා.

එසේ නම්, මෙරට ආදිවාසී සහ ගෝත්‍රික ජනතා සම්මුතිය අපරානුමත - ratify කිරීමට අවශ්‍ය පියවර ගැනිමට රජය කටයුතු කරන්නේද? විපක්ෂයේ අපගේ පූර්ණ සහයෝගය හා ශක්තිය ඊට ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. එය ක්‍රියාවට නංවන නිශ්චිත දින වකවානු කවරේද?

**3. ආදිවාසීන්ගේ පාරම්පරික වාසස්ථාන මෙන්ම, ඔවුන්ගේ ජීවනෝපායට අදාළ ඇතැම් ක්‍රියාකාරකම් වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත, වන සංරක්ෂණ ආඥා පනත, වෙරළ සංරක්ෂණ වැනි පනත් මගින් අපරාධමය ක්‍රියා වශයෙන් අර්ථ දක්වන බව රජය දන්නේද?**

එසේ නම්, එම සියලු අණපනත් ආදිවාසී ප්‍රජාවට අසාධාරණයක් සිදු නොවන අයුරින් සංශෝධනය කිරීමට රජය කටයුතු කරන්නේද?

මොවුන්ගේ පාරම්පරික ඉඩම්වල හිමිකම් ගැටලු නිරාකරණය සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

**4. මෙරට ආදිවාසී ජනතාව මුහුණ දෙනු ලබන අභියෝග පිළිබඳව විමසා බැලීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ආදිවාසීන් සහ රාජ්‍ය නිලධාරීන්ගෙන් සැදුම්ලත් "ආදිවාසී ප්‍රජාවයේ අයිතිවාසිකම් පිළිබඳ ස්වාධීන කමිටුවක්" සහ "පාර්ලිමේන්තු අනුකමිටුවක්" පත් කිරීමට කටයුතු කරන ලෙස ආදිවාසීන් විසින් ඉල්ලීමක් කර තිබේ.**

ගරු අගමැතිතුමනි, ආදිවාසි ප්‍රජාව ඔවුන් වෙනුවෙන් පාර්ලිමේන්තු අනුකමිටුවක් ඉල්ලනවා, ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් පිළිබඳ සොයා බලන්න ස්වාධීන කමිටුවක් ඉල්ලනවා. මා ඔබතුමාගෙන් අහන්න කැමතියි, ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසීම් පිළිබඳ ස්වාධීන කටුවක් සහ යම්කිසි ආංශික අධීක්ෂණ කාරක සභාවක් යටතේ කමිටුවක් පිහිටුවීමට රජය කටයුතු කරන්නේද, එසේ නම් ඒ කවදාද කියලා.

**5. ආදිවාසී ප්‍රජාවගේ සාම්ප්‍රදායික ජීවනෝපායයන් හා බැඳුණු කටයුතු අපරාධමය වැරැදි වශයෙන් පෙන්වන පසුබිමක් තුළ සහ පාරම්පරික වාසස්ථාන අහිමි වීම නිසා නව වාසස්ථාන ගොඩනගා ගැනීම සඳහා බොහොමයක් ආදිවාසීන් ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගැනීමට යොමු වෙලා තිබෙනවා.**

එහිදී අපැහැදිලි කොන්දේසි මත ණය ලබා දීම, අධික පොලී අනුපාත, නීති විරෝධී සහ සදාචාර විරෝධී අය කර ගැනීමේ ක්‍රම මගින් ඔවුන් සූරා කෑමට ලක්වීම නිසා අද වන විට පුළුල් සමාජ ප්‍රශ්න රැසක් උද්ගත වී තිබෙනවා. ඉඩම්, ජීවනෝපාය, අනන්‍යතාව සහ සංස්කෘතිය සංකීර්ණ ලෙස එකිනෙක හා බැඳී ඇති සහ වෙන් කළ නොහැකි ලෙස පවතින හෙයින් ආදිවාසි ජනතාවගේ ක්ෂුද්‍රමූල්‍ය ණය ප්‍රශ්නයට විසඳුම් සෙවීමේදී මෙම බහුවිධ ප්‍රශ්න වලට අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යව තිබෙනවා. ආදිවාසී ජනතාව මුහුණ දෙනු ලබන මෙම ක්ෂුද්‍රමූල්‍ය ණය අර්බුදයට විසඳුම් ලබා දීමට රජය විශේෂ අවධානය යොමු කරන්නේද?




- **විදුර වික්‍රමනායක (බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ඇමති)**

විරුද්ධ පක්ෂයේ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයේ හැම අනු ප්‍රශ්නයකටම උත්තරය සරලව කිව්වොත්, "ඔව්". එසේ වුවත්, එතුමා ඊට වැඩිය ගැඹුරු උත්තරයක් බලාපොරොත්තු වෙනවා නම්, අපි ඒ උත්තරයත් ලබා දෙන්න සූදානම්.

ඒ අනුව, එතුමා විමසූ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

**1. ඔව්. ආදිවාසී ප්‍රජාවගේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික, සිවිල් හා දේශපාලන. අයිතිවාසිකම්වල සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් තවදුරටත් අධ්‍යයනය කර අවශ්‍යයතාව අනුව නව පනත් කෙටුම්පතක් හෝ පවතින පනත් සඳහා සංශෝධන එකතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම දැනටත් ආරම්භ කර ඇත.**

නිශ්චිත කාලරාමුව, මාස 6යි. මාස 6ක් තුළ මේ සියල්ල සම්පූර්ණ

කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට හෝ පනත්වලට සංශෝධන යන ඒමයි අපේ අදහස.

**2. ඔව්. සුවිශේෂී අනන්‍යතා සහිත ප්‍රජාවල උරුම සංරක්ෂණ ඒකකය මේ වන විට අපි ස්ථාපිත කර තිබෙනවා.**

ඒකේ මේ කණ්ඩායම විතරක් නොවෙයි, අපේ රටේ සිටින තවත් විවිධ කණ්ඩායම් ඉන්නවා සුවිශේෂී අනන්‍යතා තිබෙන, සුවිශේෂී සංස්කෘති සහිත ඒ සියලු කුඩා කණ්ඩායම්වල උරුම සුරක්ෂිත කිරීම සමග ඒ කණ්ඩායම්වල අනාගත පරම්පරාවට අපේ රටේ අනෙකුත් ප්‍රජාව අත්විඳින්නා වූ සියලු වරප්‍රසාද හා අයිතිවාසිකම් ලබා දීමේ වැඩ පිළිවෙළ සඳහායි අපි මේ අංශය පිහිටුවා තිබෙන්නේ.

*රජයක් හැටියට අපෙන් ඉල්ලා සිටින්නේ, ජාතික ප්‍රතිපත්තියක් ලෙස මේවා ක්‍රියාත්මක කරන ලෙසයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරැකීමේ ප්‍රතිපත්ති සංක්ෂේපණ සඳහා රජය ඉක්මණින් කටයුතු කරන බව සඳහන් කරන්න ඕනෑ.*

a) ඒ අනුව ආදිවාසී ජනතාවගේ ඉල්ලීම් සහ අවශ්‍යතා සලකා බලා අවශ්‍ය කටයුතු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය තුළ "සුවිශේෂී අනන්‍යතා සහිත ප්‍රජාවගේ උරුම සංරක්ෂණ ඒකකය" නමින් අංශයක් ස්ථාපිත කර ඇත. එම ඒකකය මගින් ආදිවාසී ජනතාවගේ ඉල්ලීම් ඉටු කර දීමට අදාළ අනෙකුත් දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය කටයුතු සිදු කර ඇත. (අදාළ වාර්තා ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත)

b) ආදිවාසීන්ගේ ගම් මට්ටමට ගොස් ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කර විසඳුම් සෙවීම. (අදාළ වාර්තා ඇමුණුම් අංක 02 හි දක්වා ඇත.)

c) අදාළ සියලු ආයතන එක්ව මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කර එහිදී ආදාළ ගැටලු සාකච්ඡා කිරීම. (අදාළ වාර්තා ඇමුණුම් අංක 03 හි දක්වා ඇත.)

**3. ඔව්. මෙම පනත් සංශෝධනය සඳහා අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණය වී අවශ්‍යය සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.**

ආදිවාසී ජනයාට හිමි පාරම්පරික ඉඩම්වල හිමිකම යළි ලබා දෙන ලෙස ඔවුන් විසින් ඉල්ලීම් කරනු ලබන අතර, ඒ සඳහා ඊට අදාළ ආයතන වන ඉඩම් අමාත්‍යාංශය, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වාරිමාර්ග අමාත්‍යාංශය සමග සාකච්ඡා කර ඔවුන්ගේ පාරම්පරික ඉඩම් යළි ඔවුන් වෙත ලබා දීමට අවශ්‍ය පියවර දැනටමත් ආරම්භ කර ඇති බව මෙම ගරු සභාවට දන්වා සිටියි.

**4. ඔව්. පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ අනුකමිටුවක් පත් කිරීමට අදහස් කරන අතර, මීළඟ උපදේශක කාරක සභාවේදී එම අනුකමිටුව පත් කිරීමට නියමිතය.**

**5. ඔව්. මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කර මේ සඳහා සහනදායී ක්‍රමයක් සකස් කිරීමට අපේක්ෂා කරමි.**

දශක ගණනාවක් පුරා පැවත එන ප්‍රශ්න රජයන් ගණනාවකින් නොසලකා හැර ඇති බව පැහැදිලිය. ක්‍රමානුකූල විධිමත් ක්‍රමයක් ඔස්සේ මේ ප්‍රශ්න සහ ගැටලුවලට විසඳුම් ලබාගත යුතුය. නොඑසේ නම්, මෙතෙක් කල් කළා වාගේ පය බරවායට පිටිකර බෙහෙත් බැන්දා සේ නිශ්ඵල ක්‍රියාදාමයකට ජනතා මුදල් වියදම් කිරීම සිදු වනු ඇත. එසේ නොවන්නට පාර්ලිමේන්තුවේ සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ එකමුතුකම සහ සහෝදර සහභාගීත්වය අපේක්ෂා කරමු.



ඡායාරූප: mfa.gov.lk

• **දිනේෂ් ගුණවර්ධන - අග්‍රාමාත්‍ය**

රජයක් හැටියට අපෙන් ඉල්ලා සිටින්නේ, ජාතික ප්‍රතිපත්තියක් ලෙස මේවා ක්‍රියාත්මක කරන ලෙසයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරැකීමේ ප්‍රතිපත්ති සංක්ෂේපණ සඳහා රජය ඉක්මණින් කටයුතු කරන බව සඳහන් කරන්න ඕනෑ. නිදහස් උත්සවයේ විශේෂ නියෝජිත පිරිසක් ලෙස ආදිවාසී නායකයාගේ නියෝජිත පිරිසට සහභාගී වෙන්න කියලා මම ආරාධනා කළා. ඔවුන් ඉතාම ඕනෑකමින් එය පිළිගත්තා. පාර්ලිමේන්තුව හැටියටත් රජය හැටියටත්, ඒ වගේම මේ සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඇති කිරීමට ගරු අමාත්‍යතුමා ප්‍රතිඥාවක් දුන්නා. ඒවා ක්‍රියාත්මක කිරීමට අපි කටයුතු කරන බව මේ අවස්ථාවේදී යළිත් සඳහන් කරනවා. ඒ පිළිබඳ විශේෂ සාකච්ඡා කිහිපයක් පාර්ලිමේන්තුව හැටියට ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ■

**- ටිරාන් බංගගමආරච්චි**



# පොළොවේ උරුමය රකිමින්

ආදිවාසී ජනතාව මෙරට සුළු ජන වර්ගයක් බවට පත් වී ඇති නිසාම ඔවුහු බරපතළ ප්‍රශ්න රැසකට මුහුණ දෙති. ආදිවාසීහු බොහෝ විට ඔවුන්ගේ වාර්ගිකත්වය, සංස්කෘතිය සහ භාෂාව අනුව වෙනස් කොට සැලකීමට ලක් වේ. මේ නිසා සමාජ බැහැර කිරීම්, ආර්ථික අවාසි සහ දේශපාලන බල ගැන්වීම් වලටත් බඳුන් වේ. මෙරට වෙසෙන දුප්පතුන් අතර ආදිවාසී ජනතාව ඉහළින්ම නියෝජනය වේ. වෙනස් කොට සැලකීම, අධ්‍යාපන හා රැකියා අවස්ථා සඳහා ප්‍රවේශයන් නොමැතිකම, ඉඩම් අහිමි කිරීම ඇතැළු කරුණු ගණනාවක් මෙයට හේතු වේ.

සියවස් ගණනාවක් පුරාවට ආදිවාසීන්ට ඔවුන්ගේ පාරම්පරික ඉඩම් අහිමි කර ඇත. මෙය ඔවුන්ගේ සංස්කෘතිය, ආර්ථිකය සහ ජීවනෝපාය කෙරෙහි විනාශකාරී බලපෑමක් පර ඇත.

ආදිවාසීන්ගේ පාරම්පරික ඉඩම් බොහෝ විට ස්වභාවික සම්පත්වලින් ගහනය. මෙම සම්පත් රජය සහ පෞද්ගලික සමාගම් විසින් සූරා කෑමට ලක් කිරීම බහුලව දැකිය හැකිය. මෙය පාරිසරික විපර්යාසයට හේතු වනවා සේම ආදිවාසී ප්‍රජාවගේ අවතැන් වීමට ද හේතු වේ.

*ආදිවාසීන්ගේ පාරම්පරික ඉඩම් බොහෝ විට ස්වභාවික සම්පත්වලින් ගහනය. මෙම සම්පත් රජය සහ පෞද්ගලික සමාගම් විසින් සූරා කෑමට ලක් කිරීම බහුලව දැකිය හැකිය. මෙය පාරිසරික විපර්යාසයට හේතු වනවා සේම ආදිවාසී ප්‍රජාවගේ අවතැන් වීමට ද හේතු වේ.*

මේ හේතු නිසා ආදිවාසීන් රජය සහ ආරක්ෂක අංශවල ප්‍රචණ්ඩත්වයට මෙන්ම මානව හිමිකම් කඩ වීම් වලට ද ගොදුරු වනු ඇත.

ආදිවාසී ජනතාව මුහුණ දෙන ඉඩම් ප්‍රශ්නය බරපතළ ප්‍රශ්න ගණනාවකට පිඹුරුපත් සකසයි. වර්ෂ ගණනාවක් වියළි කලාපයේ ජීවත් වූ මෙම පිරිස මූලික වශයෙන් පශු සම්පත් ගොවීන් වූ අතර ඉඩම් මත යැපීම මේ නිසාම සිදුවිය. එහෙත් ඉඩමට නීත්‍යානුකූල අයිතියක් නැත. සාම්ප්‍රදායිකව වාර්ගික ඉඩමක ජීවත් වූ නමුත් ඔවුන්ට එම ඉඩමේ අයිතියක් නොමැත. මේ නිසාම රජයේ සහ පෞද්ගලික ව්‍යාපාරිකයන්ගේ ගොදුරු බවට මේ ඉඩම් පත් වේ. වාරිමාර්ගික යෝජනා ක්‍රම සහ ජාතික වනෝද්‍යාන වැනි සංවර්ධන ව්‍යාපෘති සඳහා වියළි කලාපයේ ඉඩම් විශාල ප්‍රමාණයක් රජය විසින් අත්පත් කරගෙන ඇත. මේ නිසාම ආදිවාසීන්ට සිය පාරම්පරික ඉඩම්වලින් අවතැන් වීමට සිදු වී ඇත. මෙය රජයෙන් පමණක් වන හිරිහැරයක් නොව පෞද්ගලික ව්‍යාපාරිකයින්ද මෙම ඉඩම්වලට බැල්ම දමයි. ඒ මේ ප්‍රදේශ සංචාරක ව්‍යාපාරවලට ඉහළ විභවයක් පවතින බැවිනි.

නිරන්තරයෙන්ම නියඟයෙන් බැට කන මේ ප්‍රජාව ඒ නිසාවෙන්ද ඉඩම් ප්‍රශ්නවලින් හෙම්බත් වෙති. නියඟය හේතුවෙන් පශු සම්පත් නඩත්තු කිරීම ඉතා අපහසු වේ. මේ නිසාම ඉඩම් සොයා වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීමට ආදිවාසීන්ට සිදු වේ. මේ නිසාම ඔවුන්ගේ සමාජ හා සංස්කෘතික ජීවිතය කඩාකප්පල් වේ. අඩු වැටුප් සහිත රැකියා කිරීමට ආදිවාසීන් පෙළැඹෙනුයේ මේ නිසාය. ■

**- පුරවැසියා**

# ආදිවාසීන්ගේ සියලුම ගැටලු අගමැතිට දැනුම් දී තිබෙනවා

**නිශාන්ති ජයසිංහ**
අතිරේක ලේකම්
සංවර්ධන උරුමය



- **ආදිවාසීන් මේ වන විට ගැටලු ගණනාවකට මුහුණ දෙනවා. ඒ අතර ස්ථිර නිවාස ප්‍රශ්නය ප්‍රධාන තැනක් ගන්නවා. රතුගල මෙන්ම වාකරේ ආදිවාසීන් ස්ථිර නිවාස ව්‍යාපෘතීන් දැනටමත් ඉල්ලා තිබෙනවා. ඒ වෙනුවෙන් ගෙන ඇති පියවර මොනවාද?**

ආදිවාසීන් අපේ අමාත්‍යාංශය යටතට අයත් වුණත් ඒ අය මුහුණ දෙන ගැටලු බොහොමයකට විසඳුම් හොයන්න වෙලා තියෙන්නෙ වෙනත් අමාත්‍යාංශය හරහායි. මෙම නිවාස ප්‍රශ්නයට පිළිතුරු තිබෙන්නෙ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය තුළයි. මෙතනදී අපි මේ ප්‍රශ්න විසඳලා දෙන්න කියලා 2022-09-12 දිනැති NH/P&D/06/28 ලිපිය මගින් දැනුම් දීලා තියෙනවා. ඊට ප්‍රතිචාර ලෙස 2022-10-10 දින MSUP/P&M/PS/2022 ලිපියක් මගින් ඊට කඩිනම් පිළිතුරු ලබාදෙන බවට පොරොන්දු වෙලා තියෙනවා.

- **නිවාස වගේම බරපතළ ප්‍රශ්නයක් පානීය ජල පහසුකම් නොමැතිකම. දැනටමත් මේ ප්‍රශ්නයෙන් රතුගල හා වාකරේ ආදිවාසීන් ප්‍රබලව පෙළෙනවා.**

මේක ජල සම්පාදන අමාත්‍යාංශයෙන් විසඳිය යුතු ප්‍රශ්නයක්. අපි ආදිවාසී ජනතාවගේ පානීය ජල ගැටලු විසඳලා දෙන්න කියලා 2022-09-16 දින ලිඛිතව බාරදීල තියෙනවා. ඒකට ප්‍රතිචාර ලෙස ජලසම්පාදන අමාත්‍යාංශය මගින් ලිඛිතව දැනුම් දීලා තියෙනවා මේ ගැන කඩිනම් ක්‍රියාමාර්ග ගන්නවා කියලා. (2022-10-07 වැනි දින)

- **2022 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන සංගණනය සඳහා වැදි ජනයා වෙනම ජනවර්ගයක් ලෙස ගණන් ගැනීම ගැන ඔබගේ අදහස කුමක්ද?**

ආදිවාසී ප්‍රජාව මුහුණ දී ඇති ගැටලු හා සංවර්ධන අවශ්‍යතා අතුරින් වැදි ජනයා වෙනම ජන වර්ගයක් ලෙස ගණනය කිරීමේ ගැටලුව සම්බන්ධයෙන් මැදිහත් වන ලෙස 'ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත 2022-09-16 දින ලිඛිතව දැනුම් දීලා තියෙනවා. එයට ප්‍රතිචාර ලෙස ඔවුන් අපිව දැනුවත් කරලා තියෙනවා '2024දී ජන හා නිවාස සංගණනයේ ප්‍රශ්නාවලිය සකස් කර ඇති බවත් එහිදී ප්‍රමාණවත් දත්ත ප්‍රමාණයක් ලැබේ නම් අදාළ තොරතුරු ලබාදීමට පියවර ගන්නවා' කියලා.

- **දඹාන ආදිවාසී ගම්මානය තුළ ප්‍රශ්න ගණනාවක් තියෙනවා. මේ පිළිබඳ ඔබ අමාත්‍යාංශය දැනුවත් කර තියෙනවා. ඊට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?**

ඔව්! දඹාන ආදිවාසී ගම්මානයේ ප්‍රශ්න ගණනාවක් තියෙනවා. මාර්ග, පාලම් සකස් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම් සඳහා මැදිහත් වන ලෙස පවා ඉල්ලීම් තියෙනවා. මේවාට විසඳුම් ලබාගන්න ඕන ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මේ හැම තැනටම අපි මේ ප්‍රශ්න යොමු කරලා තියෙනවා. ඒ ආයතනවලිනුත් ඒ ගැන හොයා බලනවා කියලා ප්‍රතිචාර දක්වලා තියෙනවා.

- **වනජීවී අධ්‍යක්ෂ ජනරාල් හා වැදි නායක ඌරුවරිගේ වන්නියලා ඇත්තන් අතර වර්ෂ 2011 ජූලි මස ඇති කරගත් අවබෝධතා ගිවිසුමෙහි සඳහන් වගන්ති පාර්ලිමේන්තුව තුළ සම්මත කර නීතියක් බවට පත් කර තියෙනවද?**

ආදිවාසී ප්‍රජාව මුහුණ දී ඇති ගැටලු හා සංවර්ධන අවශ්‍යතා අතරින් වනජීවී අධ්‍යක්ෂ හා ආදිවාසී නායකතුමන් අතර ඇති කරගෙන තිබෙන අවබෝධතා ගිවිසුම නීතියක් බවට පත්කිරීම, දැල් මගින් ධීවර කටයුතු කිරීම, අලි තර්ජනය, දෛනික කාර්යයන් සඳහා යාබද කැලෑව ලබාදීම, ආදර්ශ වැදි ගම්මානයක් පිහිටුවීම, පුහුණු මධ්‍යස්ථානයක් සකස් කිරීමේ ගැටලු සම්බන්ධයෙන් මැදිහත් වන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2022-09-16 දිනැති NH/P&D/06/28 ලිපිය මගින් දැනුම් දීල තියෙනවා.

ඒ ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරවලින් කියැවුණේ ධීවර කටයුතු සඳහා මාදුරුඔය ජලාශයේ අවස්ථාව දී ඇති නමුත් බලපත්‍ර ලබාගැනීමට කිසිදු ආදිවාසියෙකු අයදුම්පත් යොමු කර නැති බවයි. වන අලි හානි වැළැක්වීම සඳහා විදුලි වැට ඉදිකිරීමේ නඩත්තු කටයුතු සිදුකරන බවත්, තෝරාගත් ආදිවාසී

පිරිසක් සඳහා මාදුරුඔය ජාතික උද්‍යානයේ රැකියා අවස්ථා ලබාදී ඇති බවත්, හෙනානිගල දූපතේ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත අනුව අවසර ලබාදිය නොහැකි බවත්, ඒ සඳහා ජාතික උරුම අමාත්‍යාංශයෙන් ඉදි කළ සංස්කෘතික මධ්‍යස්ථානය සුදුසු බවත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2023.04.25 දින ලිඛිතව දැනුම් දීලා තියෙනවා.

- **ආදිවාසී ජන උරුම විහාරස්ථානයේ නේවාසිකාගාරය, භාවනා මධ්‍යස්ථානය යන මායිම් වැට සකස් කිරීම දිගුකාලීන ඉල්ලීමක් නේද?**

ආදිවාසී ජන උරුම විහාරස්ථානයේ නේවාසිකාගාරය, භාවනා මධ්‍යස්ථානය සහ මායිම් වැට සකස් කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයයි. අපි මේ ගැන ඒ අයගෙන් විමසුවා (2022-09-16 දින ලිඛිතව) එතකොට අපිට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විහාරස්ථානයේ භික්ෂු නේවාසිකාගාරය සඳහා රු. 133,590,000.00ද, භාවනා මධ්‍යස්ථානය සඳහා රු. 44,286,000.00ද මායිම් වැට ඉදිකිරීම සඳහා දික් අඩියක් රු. 950/- බැගින් ද වූ ඇස්තමේන්තුවක් 2023-11-10/2023-12-23 දිනැති NPPD/LPP/JANAUPUMA/01 ලිපි මගින් ඉදිරිපත් කර තියෙනවා.

වාර්ෂික ආදිවාසී දින සැමරුම් උත්සවය සංවිධාන කටයුතු සිදුකිරීම, දළදා මාලගාවේ මී පැණි පූජාව සංවිධානය, දඹාන හා හේනානිගල දෙ ශාන්තිකර්මය සංවිධානය කිරීම වගේ ආදිවාසී සුවිශේෂ සංස්කෘතික අංග පවත්වාගෙන යාම සඳහා මෙම අමාත්‍යාංශය මගින් වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කෙරෙනවා. මේ සියල්ල කරන්නෙ බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විදිහට අපි තමයි.

ඒ වගේම දඹාන ආදිවාසී කෞතුකාගාරය වැඩි දියුණු කිරීම එහි කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම, නඩත්තු කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් සිදු කරන්නෙ. කෞතුකාගාරයේ ඉලුක් වහලය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා රු. 486,663.17ක ඇස්තමේන්තුවක් ගෙන්වාගෙන තියෙනවා.

- **ආදිවාසී ප්‍රජාව අතර අසමගිය, අඩු වයස් විවාහ, ද්විත්ව විවාහ සිදුවීම සහ පාසල් ළමුන්හට නිසි අධ්‍යාපනයක් නොලැබීම. දඹකාන ආදිවාසී ගම්මානය තුළ බහුලව දකින්න ලැබෙනවා.**

ඔව්! දළුකාන ආදිවාසී ගම්මානය කේන්ද්‍ර කරගනිමින් සමාජ සජීවීකාරක වැඩසටහනක් පැවැත්තුවා. එතනදී ආර්ථික අපහසුතා ඇති පවුල්වල ළමුන් 85 දෙනෙක් සඳහා පාසල් උපකරණ ලබා දුන්නා. අපි ඉදිරියේදී හැම ආදිවාසී ගම්මානයක් සඳහා සමාජ සජීවීකරණ වැඩසටහන් පවත්වන්න සැලසුම් සකස් කරනවා. සෙසු ප්‍රශ්නවලට ඒ හරහා පිළියම් යෙදීමට බලාපොරොත්තු වෙනවා.

- **වැදි ජනතාවගේ ප්‍රධාන අංගයක් වන මී කැඩීම හා පලවැල නෙළීම සඳහා දිඹුලාගල කන්ද ආශ්‍රිත වනාන්තරයට යාම සඳහා දළුකාන ආදිවාසීන් ඉල්ලනවා නේද?**

ඒක වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විසඳාගත යුතු ප්‍රශ්නයක්. අපි ඒ ගැන ඔවුන් සමග සාකච්ඡා කරනවා. හඳුනාගත් පිරිසක් සඳහා රක්ෂිත කැළයට ඇතුළුවීම සඳහා විශේෂ හැඳුනුම්පතක් ලබාදීමට උත්සාහ කරනවා.

- **ඇතැම් ආදිවාසී ළමුන්ට උප්පැන්නය පවා අහිමියි. මෙය බරපතළ තත්ත්වයක් නේද?**

එහෙම උප්පැන්න අහිමි ළමයි ඉන්නවා. ඒ ළමුන්ගේ යාවත්කාලීන තොරතුරු හා උපත් වාර්තා ලබාගෙන උප්පැන්න ලබාදීමේ වැඩසටහනක් මේ වනවිටත් ආරම්භ කරලා තියෙනවා.

- **පොල්ලේබැද්ද ආදිවාසී ජනාවාස සඳහා වෙන්වූ නිශ්චිත ස්ථානයක් නෑ. ඒ වගේම පරිහානියට පත්වෙමින් පවතින සංස්කෘතික මධ්‍යස්ථානය ආදායම් උත්පාදිත ස්ථානයක් බවට පත් කරන්න බැරිද?**

පුළුවන්. සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් ඉලක්ක කරගනිමින් රඹකැන් ඔය ජලාශය ආසන්නයේ ආදිවාසී සංස්කෘතික මධ්‍යස්ථානය සමීප වනාන්තරයේ ඇති ගල්ලෙන් පදනම් කරගෙන ආදර්ශ ආදිවාසී ගම්මානයක් සකස් කිරීමටත්, සංචාරක නියෝජිතයන් මගින් එම ප්‍රදේශය වෙත සංචාරකයන් ආකර්ෂණය කරගැනීමට ඇති හැකියාව සොයා බැලීමටත් කටයුතු කරනවා. ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහායත් ලැබෙනවා.

- **රතුගල ආදිවාසී ගම්මානයේ අරළු, බුළු, නෙල්ලි වැනි ඖෂධ බහුලව තියෙනවා. මේවා සෘජුව විකිණීමේ ක්‍රමවේදයක් සකස් කළ නොහැකිද?**

අපි දැනටමත් ඖෂධ ගෙන ඒම සඳහා බහාලුම් ලබාදීලා තියෙනවා. ඉදිරියේදී ඖෂධ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට සැලසුම් කරලා තියෙනවා. එහිදී ඖෂධ සෘජුව මිලදී ගැනීමට පුළුවන් වෙයි. ඊට අමතරව ඖෂධ වගාවට අවශ්‍ය පැළ හා තාක්ෂණික දැනුම ලබා දෙන්නත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සමග කටයුතු කරනවා.

- **අභාවයට යන වැදි භාෂාව රැකගැනීමට ඔබ අමාත්‍යාංශය වැඩපිළිවෙළක් සකස් කරලා තියෙනවද?**

මේ ප්‍රශ්නය ඇතැම් ආදිවාසී ගම්මානවල බහුලව දකින්න ලැබෙන ප්‍රශ්නයක්. විශේෂයෙන්

රතුගල ආදිවාසී ගම්මානය එවැනි එකක්. අපි මේ නිසා එම දරුවන් සඳහා ආදිවාසී භාෂාව ඉගැන්වීම සඳහා භාෂා පන්ති පවත්වනවා. මේ සඳහා වියදම් කළ මුදල රු. 335,120.00ක්.

- **රතුගල ආදිවාසී ගම්මානය ප්‍රධාන මාර්ගයේ පිහිටා තියෙන්නෙ. මේ නිසාම සංචාරක ආකර්ෂණය වැඩි කරගන්න වැඩපිළිවෙළක් හදන්න පුළුවන් නේද? එවිට එම ජනයාට ආදායම් උත්පාදනය කරගන්නත් පහසු වේවි.**

ඒවට ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් රතුගල ආදිවාසී ගම්මානය කේන්ද්‍ර කරගනිමින් කෞතුකාගාරයක්, පුස්තකාලයක්, අලෙවි මධ්‍යස්ථානයක්, රැස්වීම් ශාලාවක් පවත්වාගෙන යනවා.

ආදිවාසීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම, සංස්කෘතිය සමාජගත කිරීම, සංචාරක ආකර්ෂණය සහිත ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් මධ්‍යම සංස්කෘතික අරමුදල මේ වන විටත් ආරම්භ කරලා තියෙනවා.

ආදිවාසීන් සම්බන්ධ කර ගනිමින් මී පැණි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක්ද මේ වන විටත් ක්‍රියාත්මක කරගෙන යනවා.

- **ඔබගේ අමාත්‍යාංශය බොහෝ ක්‍රියාමාර්ග ගෙන ඇතත්, ඒවා ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයක් පවතිනවා නේද?**

මේක ලොකු කාර්යයක්. ආදිවාසීන් අපේ අමාත්‍යාංශයට අයත් වුණාට ඔවුන්ගේ ප්‍රශ්න එකපාර විසඳන්න අපිට බැහැ. ආදිවාසීන්ගේ ඉඩම් ගැටලු විසඳන්න අපි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය එක්ක එකතු වෙන්න ඕන. ජල ප්‍රශ්න විසඳන්න ජල සම්පාදන අමාත්‍යාංශය ඒ වගේම වනයේ ඇතිවන ප්‍රධාන ප්‍රශ්න විසඳන්න වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහය ඕන වෙනවා. මාර්ග ප්‍රශ්න ගත්තත්, අනෙක් හැම ප්‍රශ්නයක් ගත්තත් කොතනකට හරි සම්බන්ධයි. ඒ නිසා මේ ආදිවාසී ගැටලු ක්ෂණිකව විසඳන්න බැහැ. ඒ නිසාම අපි දැන් මේ ගැටලු සේරම අගමැතිතුමාට දැනුම් දීලා තියෙනවා. එතුමාගේ ප්‍රධානත්වයෙන් මේ සියලු අමාත්‍යාංශ එකතු කරලා මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න කියලා. ඊට යහපත් ප්‍රතිචාරයක් ලැබෙයි කියලා අපි හිතනවා. ඒ වගේම මේ ඇතැම් ප්‍රශ්න විසඳගන්න ආදිවාසීන්ගේ සහායත් ඕන. ඇතැම් ක්‍රියාමාර්ග ගන්නවට ඔවුන් විරුද්ධයි. කොහොම වුණත් අගමැතිවරයා හරහා යහපත් ප්‍රතිඵලයක් ලැබෙයි කියලා අපි හිතනවා.

(ආදිවාසීන් මුහුණ දෙන ගැටලු ගැන කතා කිරීමට සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක ඇමතී විට ඉතා යහපත් ප්‍රතිචාරයක් දැක්වූ අමාත්‍යවරයා ඒ පිළිබඳ විධිමත් කතාබහක් පැවැත්වීම සඳහා නිශාන්ති ජයසිංහ මහත්මියව සම්බන්ධ කරවීය. තම විෂය පථයන් ගැන නිසි අවබෝධයක් සමාජ ගතකිරීමට අමාත්‍යවරයා දක්වන සහයට අපි බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමු.)

**- විරාන් බංගගමආරච්චි**

# මේවා දිග පළල තැනෙක තිබෙන ප්‍රශ්න

**දඹානේ ගුණවර්ධන**

ආදිවාසීන් විදිහට අපේ අයගේ මූලික අයිතිවාසිකම් ගැටලුවට විසඳුම ආණ්ඩුවෙන් ඉටු කරලා දීලා නෑ. ඉඩම් ප්‍රශ්න ආර්ථික ප්‍රශ්න විතරක් නෙමේ බාහිර සමාජයෙන් එන ප්‍රශ්නත් ඒ අයගේ සමාජ සංස්කෘතික ජීවිතයට බරපතළ ආකාරයට බලපෑම් සිදු කරල තියෙනවා.

මෙහිදී මත්ද්‍රව්‍ය ප්‍රශ්නය ඉතාම සංකීර්ණයි. වයස අවුරුදු දහයේ දොළහේ දරුවන් පවා වේගයෙන් මත්පැන්වලට ඇබ්බැහි වෙලා. ඒ නිසා ඒ අය එහෙටත් නැති මෙහෙටත් නැති පිරිසක් බවට පත් වෙලා තියෙනවා. මේ විදිහට ගියොත් ආදිවාසී අනාගතය නම් අවිනිශ්චිතයි කියන එක කිව හැකියි.

දඹානේ හිටපු සමහරුන්ට මහවැලි ව්‍යාපාරය යටතේ දානිගලින් ඉඩම් ලැබුනා. ඒ අය අක්කර භාගයක කොටු වෙලා. නිදහසේ හිටපු ඒ උදවියගේ මානසික තත්ත්වය දැන් කොහොමට ඇද්ද?

කැලේ යන්න දෙන්නෙ නෑ. ගොවිතැනෙන් ප්‍රමාණවත් ආදායමක් නෑ. අලි ප්‍රශ්නත් තිබෙනවා. මේවා බොහෝම දිග පළල තැනෙක තිබෙන ප්‍රශ්න. ■

**- පුරවැසියා**

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

ලිපිනය : අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන : +94112081384, +94112081385, +94112081386
ෆැක්ස් : +94112081388
විද්‍යුත් තැපැල : info@cpalanka.org
වෙබ් අඩවිය : www.cpalanka.org
මුහුණුපොත : www.facebook.com/cpasl
ට්විටර් : @cpasl